කොළඹ දිසා අධිකරණ අංක 01.

දිසා විනිසුරු සඳුන් විතාන මැතිතුමා ඉදිරිපිටදී ය.

නඩු අංකය:-DMR-01435-23

දිනය:- 2023.08.03

සටහන් ගැනීම:-ලසු ලේඛිකා ඩබ්.ඒ.ට්‍රිෂාදි විෂ්මිකා විසිනි.

පැමිණිලිකරුවන් වෙනුවෙන් නීතිඥ සංජය ෆොන්සේකා මහතාගේ උපදෙස් මත නීතිඥ ජීවන්ත දි සිල්වා සහ නීතිඥ චානක ජයරත්න මහතුන් සමග ජනාධිපති නීතිඥ රොනෙල් පෙරේරා මහතා පෙනී සිටී.

මෙම නඩුවේ 1 වන සහ 2 වන පැමිණිලිකරුවන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති සහ ලේකම් ලෙස ක්‍රියා කරනවා. ඔවුන් නීත්‍යානුකූල ඡන්දයෙන් මෙම තනතුරු වලට පත් වී තිබෙන්නේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ශ්‍රී ලංකාවේ ක්‍රිකට් සම්බන්ධයෙන් තිබෙන ජාතික ක්‍රීඩා සංගමයක්. ක්‍රීඩා නීතිය අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තමයි ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව සඳහා ඇති ජාතික සංගමය. විත්තිකරු පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් ස්වාමීනි.

ඔහුගේ ලිපිනයන් මා දන්වා තිබෙනවා මෙම පැමිණිල්ලේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ජාතික ක්‍රීඩා සංගමයක් නිසාවෙන් යම්කිසි නෛතික බැඳීම් තිබෙනවා. එකක් වන්නේ, ඔඩිටර් ජනරල් මහතාගේ බලතල වලට අනුව

03 AUG 2023

අපගේ වියදම් සහ අවුරුද්දකට යන වියදම් විගණනය කිරීමට අයිතියක් තිබෙනවා ඔඩිටර් ජනරාල්තුමාට ස්වාමීනි.

මා පැමිණිල්ලේ 6 වන ඡේදයේ සිට 14 වන ඡේදය දක්වා ගරු අධිකරණයේ අවධානය යොමු කරනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පසුගිය වසරක් දෙකක් තුළ ලැබූ ජයග්‍රහනයන් සහ කරපු ක්‍රියාකාරකම් මෙහි සඳහන් වී තිබෙනවා. 13 වන ඡේදයේ තිබෙනවා පැමිණිල්ලේ ගිය වසරේ 2022 ඔක්තෝම්බර් නොවැම්බර් මාස වලදී ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් ටීම් එක ICC T20 වර්ල්කප් ටූනමන්ට් එකේ ක්‍රීඩා කලා. ඔස්ට්‍රේලියාවේ පැවතුණේ. මා ගරු අධිකරණයේ අවධානය යොමු කරනවා පැ.3 යන ලේඛනය අනුව ගරු ක්‍රීඩා ඇමතිතුමා විසින් අපට දී තිබෙනවා මෙම ඔස්ට්‍රේලියාවේ පවතින මෙම වර්ල්කප් ටූනමන්ට් එකට සහභාගී විය හැකි පුද්ගලයන්ගේ නම්. ගිය වසරේ වර්ල්කප් එක යන අතරතුර එක්තරා ක්‍රීඩකයෙකුට විරුද්ධව චෝදනා තිබුණා. කාන්තාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනා කර තිබුණා.

ඒ අනුව නොයෙකුත් කතන්දර පැතිරිලා ඒ සම්බන්ධයෙන් ක්‍රීඩා ඇමතිතුමා විසින් හිටපු මහාධිකරණ විනිසුරු සරෝජනී කුසලා වීරවර්ධන මැතිණිය යටතේ කමිටුවක් පත් කර ඒකෙන් වාර්තාවක් කැඳෙව්වා. එකී වාර්තාව පැ.4 වශයෙන් ලකුණු කර තිබෙනවා. ඒ වාර්තාව විගණකාධිපති තුමා වෙත යොමු වෙලා ඔහු විගණන කෙටුම්පතක් නිකුත් කළා. එහි ආවරණ ලිපිය පැ.6 ලෙස ලකුණු කර තිබෙනවා. 2023 ජුනි 14 වන දින. එය මා පැ.6 ලෙස ලකුණු කර තිබෙනවා පැමිණිල්ල සමග. (එම ලේඛනය කියවා සිටී.)

03 AUG 2023

ඒ අනුව පැ.7 යනුවෙන් විගණන කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමාගේ අවධානය මේ පැ.7 ලේඛනයට යොමු කරනවා. හැම පිටුවෙම ගහල තියෙනවා කෙටුම්පත කියල. ඊට පසුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රීඩා අමාත්‍යාංශයට දන්වා තිබෙනවා මේ දින 14 මදි කල් දෙන්න කියල. ඒ අනුව අපිට අන්තිමට කල් දී තිබෙනවා 2023 අගොස්තු 16 වන දින දක්වා අපේ ලේඛන ඉදිරිපත් කරන්න. පැ.12 (B) යන ලේඛනයෙන් නියෝජ්‍ය විගණකාධිපති තුමා විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට 2023 අගෝස්තු 16 වන දින දක්වා කල් ලබා දී තිබෙනවා මෙම කෙටුම්පතට උත්තර ලබා දීමට.

කරුණු මෙසේ තිබියදී 2023 ජුලි 23 වන දින විත්තිකරු විසින් මේ පැමිණිලිකරුවන්ට සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සහ එහි සාමාජිකයින් කිහිප දෙනෙකුට විරුද්ධව ඉතාමත්ම නින්දිත ලෙස අපහාසාත්මක ලෙස ප්‍රකාශ කර තිබෙනවා. මා එය පැමිණිල්ලේ 9 වන ඡේදයේ සඳහන් කර තිබෙනවා. පැ.13 (A) යනු ඔහු ප්‍රකාශ කළ වචන ස්වාමිනි. පැ.13 (B) යනු ඒවා අන්තර්ගත CD තැටිය ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර තිබෙනවා. මේ අනුව මේ විත්තිකරු විසින් ප්‍රකාශ කර තිබෙන දේ කෙටියෙන් ගතහොත් 2023.07.26 වන දිනත් තවත් ප්‍රකාශයක් කර තිබෙනවා. ඒ තිබෙන්නේ පැ. 15 (A) සහ පැ.15 (B) යන ලේඛනය සහ CD තැටියයි. ඒවායේ සඳහන් කර තිබෙන ආකාරයෙන් අපට අපහාසාත්මකව සඳහන් කර තිබෙනවා කෙටුම්පතේ නැති දේවල්. එක එක පුද්ගලයන්ට ටිකට් අරන්දුන්නා යනුවෙන්. ඒ මොනවත් නැහැ ස්වාමීනි. මේ ප්‍රකාශ වලින් අපට අප්‍රතිකාරී

03 AUG 2023

හානියක් සිදු වෙන්නේ. මන්ද අපි නොකරපු දේවල්, විගණකාධිපතිවරයාගේ කෙටුම්පතෙහි නැති ගොඩාක් දේවල් කියා අපිට අපහාස කර තිබෙනවා.

මා ගෞරවයෙන් කියා සිටින්නේ පැ.6 ලේඛනයෙන් විගණකාධිපතිතුමා කියා තිබෙනවා මේ ප්‍රකාශ පිට සඳහන් කරන්න එපා යන බව. මන්ද මේ කෙටුම්පතක් පමණි. එසේ තිබියදී තමයි මේ වින්තිකරු මේ ප්‍රකාශය කර තිබෙන්නේ. එබැවින් අප මේ පැමිණිල්ලෙන් කියා සිටින්නේ, පැමිණිල්ලේ ආයාචනයේ (උ) ඡේදයේ සඳහන් වාරණ නියෝගයක් විත්තිකරුට සහ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන සියළුම අයට විරුද්ධව නිකුත් කරන මෙන් සහ ඒ මගින් 1 වන සහ 2 වන පැමිණිලිකරුවන්ට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හෝ එහි අනෙකුත් සාමාජිකයන්ට එරෙහිව කිසිදු අපහාසාත්මක ප්‍රකාශයක් කිරීමෙන් වලකින මෙන් වාරණ නියෝගයක් නිකුත් කරන ලෙස සහ (ඌ) අක්ෂරයෙන් සඳහන් පරිදි සිවිල් නඩු විධාන සංග්‍රහයේ 16 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සාමාජිකයන් වෙත මෙම නඩු පැමිණිල්ල දැන්වීමට අධිකරණයෙන් අවසරය ලබා දෙන ලෙස සහ සිතාසි සහ අතුරු තහනම් නියෝග නොතීසි නිකුත් කරන ලෙසයි.

එමෙන්ම ස්වාමීනි ගරු අධිකරණයට ගෞරවයෙන් දන්වා සිටින්නේ, පැ.14 ලේඛනයේ කොටසක් පමණක් පිටපත් වී ඇති බැවින් සම්පූර්ණ පිටපත මෝෂමක් මගින් ඉදිරිපත් කරන බවයි.

03 AUG 2023

## නියෝගය

පැමිණිල්ල, දිවුරුම් පෙත්සම සහ වාචික සැළකිරීම් සම්බන්ධයෙන් සෑහීමකට පත් වෙමි. පැමිණිල්ලේ ආයාචනයේ (ඊ) සහනයට අදාළව අතුරු තහනම් නියෝගයක් සම්බන්ධයෙන් වන අතුරු තහනම් නියෝග නොතීසි සහ පැමිණිල්ලේ ආයාචනයේ (උ) සහනයේ අයැද ඇති වාරණ ආඥාව නිකුත් කරමි. තවද පැමිණිල්ලේ ආයාචනයේ ඇයැද ඇති පරිදි සිවිල් නඩු විධාන සංග්‍රහයේ 16 වගන්තිය ප්‍රකාරව දැන්වීම් පළ කිරීමට පැමිණිල්ලට අවසර දෙමි. වාරණ ආඥාව අතුරු තහනම් නියෝග නොතීසි, විත්ති සිතාසි සමග විත්තියට භාර දී වාර්තා කැඳවන්න.

**කැඳවීම : 2023.08.10**

අත් කලේ

(සඳුන් විතාන)

දිසා විනිසුරු - කොළඹ

2023.08.03

ඉහත සඳහන් වන්නේ කොළඹ දිසා අධිකරණයේ අංක DMR 1435/23 දරණ නඩුවේ 2023.08.03 දිනැති නියෝගයේ සත්‍ය පිටපතක් ඔබට මෙයින් සහතික කරමි. (ඉහත අංක දරණ සටහන ගරු විනිසුරුතුමාගේ අත්සන සහිතව ලේඛනාගාරයට භාර දී ඇත.)

සකස් කලේ: විජේමින

සැසඳුවේ: (වතුරිකා)

රෙජිස්ට්‍රාර්

අතිරේක රෙජිස්ට්‍රාර්

දිසා අධිකරණය

කොළඹ 12.

V/25 550524

23/8/3

03 AUG 2023